ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

11 ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - I

කාලය : පැය 01 යි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න කියවා තේරුම් ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

සැලකිය යුතුයි :

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

01. රන්දෙණිගල, කොත්මලේ, මාදුරුඔය හා රන්ටැඹේ ජලාශ අයත් වන්නේ,

1) උඩවලව යෝජනා ක්‍රමයට ය.
2) ගල් ඔය යෝජනා ක්‍රමයට ය.
3) මහවැලි යෝජනා ක්‍රමයට ය.
4) සමනළවැව යෝජනා ක්‍රමයට ය.

02. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේදී වැව්වලින් ඉටුවන කාර්යය ඉතා වැදගත් වේ. වැවක අමතර ජලය වැවෙන් ඉවත් කිරීමට යොදා ගනු ලබන ව්‍යුහය,

1) සළපතාව
2) බිසෝකොටුව
3) සොරොව්ව
4) පිටවාන

03. ආග්නේය, අවසාධිත හා විපරීත පාෂාණවලට උදාහරණ පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1) මිනිරන්, ග්‍රැනයිට්, ඩොලමයිට්
2) පෙග්මටයිට්, හුණුගල්, කිරිගරුඬ
3) වැලිගල්, ෂේල්, හුණුගල්
4) නයිස්, ග්‍රැනයිට්, චානොකයිට්

04. බෝගවගාව පිළිබඳ දේශගුණික සාධකවල බලපෑම පිළිබඳව ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A. අල බෝගවල ආකන්ද වර්ධනය සඳහා දිවා කාලයේ වැඩි උෂ්ණත්වයක් හා රාත්‍රී කාලයේ අඩු උෂ්ණත්වයක් තිබීම හිතකර වේ.

B. කැරට් හා බීට්වල පුෂ්ප පිපීම සිදු වන්නේ එම ශාක අඩු උෂ්ණත්වයට පාත්‍ර වූ විටය.

C. දඬු කැබලි මුල් ඇද්දවීමට පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි වීම හිතකර වේ.

මෙම ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

1) A හා B පමණි
2) B හා C පමණි
3) A හා C පමණි
4) A, B හා C පමණි

05. ගොවි මහතෙකු වගාවක් ආරම්භ කිරීම පිණිස බීජ තෝරාගෙන ඒවා පැය 12ක් පමණ ජලයේ පොඟවා ක්ෂේත්‍රයේ සිටුවන ලදී. මෙලෙස බීජ ජලයේ පෙඟවීමෙන් බලාපොරොත්තු වූයේ,

1) රෝග මර්ධනය යි.
2) කෘමි මර්ධනය යි.
3) ප්‍රරෝහණය උත්තේජනය යි.
4) නියං ප්‍රතිරෝධීතාව ඇති කිරීම යි.

06. වාර්ෂික වර්ෂාපතනය අනුව ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප තුනකට වෙන්කර ඇත. එම කලාප තුන වනුයේ,

1) තෙත් කලාපය, වියළි කලාපය සහ ශුෂ්ක කලාපය යි.
2) තෙත් කලාපය, අතරමැදි කලාපය සහ වියළි කලාපය යි.
3) තෙත් කලාපය, වියළි කලාපය සහ අර්ධ ශුෂ්ක කලාපය යි.
4) උඩරට තෙත් කලාපය, මැදරට තෙත් කලාපය සහ පහතරට වියළි කලාපය යි.

07. ශාක කුල පදනම් කරගත් බෝග වර්ගීකරණය කෘෂිකර්මයේදී වැදගත් වේ. සොලනේසියේ (Solanaceae) කුලයට අයත් බෝග කාණ්ඩය වනුයේ,

1) බඩඉරිඟු, සෝයාබෝංචි හා කුරක්කන් ය
2) කවුපි, මුං හා තක්කාලි ය
3) අර්තාපල්, තක්කාලි හා මිරිස් ය
4) වට්ටක්කා, පතෝල හා වම්බටු ය


08. බෝගවල ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ගතවන කාලය බෝග වර්ගීකරණයේදී යොදාගන්නා එක් නිර්ණායකයකි. ඒ අනුව වාර්ෂික බෝග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) සෝයාබෝංචි, වී, මිරිස්, ගම්මිරිස්
2) බුලත්, වම්බටු, කරවිල, කැකිරි
3) ගෝවා, තක්කාලි, මෑ, කුරුඳු
4) බඩඉරිඟු, මුං, බණ්ඩක්කා, වී

09. ඇතැම් බෝග තනි වගා වලවල් තුළ සිටුවීමට නිර්දේශ කරනු ලබන අතර වළෙහි විශාලත්වය බෝගයේ වර්ගය අනුව වෙනස් වේ. කෙසෙල් සිටුවීම සඳහා නිර්දේශිත වගා වලක විශාලත්වය සෙන්ටිමීටර,

1) 90x90x90
2) 60x60x60
3) 30x30x30
4) 15x15x15

10. එළවළු බීජ තවාන් කිරීම සඳහා සකසනලද එකිනෙකට ආසන්නව පිහිටි සම්මත තවාන් පාත්ති දෙකක සිරස්කඩ පෙනුම පහත රූපයේ දැක්වේ.




ඉහත A හා B හි නිර්දේශිත මිනුම් අනුපිළිවෙලින් සෙන්ටිමීටර,

1) 50 හා 25 කි.
2) 80 හා 40 කි.
3) 100 හා 30 කි.
4) 125 හා 50 කි.

11. පැළවල මනා වර්ධනය සඳහා තවාන් පාත්තිවල මතුපිටට යෙදීමට නිර්දේශිත තවාන් මිශ්‍රණයේ මතුපිට පස් හා කොම්පෝස්ට් අනුපාතය,

1) 1 : 1 කි.
2) 1 : 2 කි.
3) 1 : 3කි.
4) 2 :1 කි.

12. ශාකවලට අත්‍යාවශ්‍ය මහා පෝෂක පමණක් අඩංගු වරණය කුමක්ද?

1) කාබන්, හයිඩ්‍රජන් හා නයිට්‍රජන්
2) කාබන්, නයිට්‍රජන් හා බෝරෝන්
3) ඔක්සිජන්, පොස්පරස් හා ක්ලෝරීන්
4) කැල්සියම්, මැග්නීසියම් හා සින්ක්

13. බෝග වගාවේ ත්‍රිත්ව සුපර් පොස්පේට් පොහොර බහුලව යොදාගැනේ. මෙම පොහොර වර්ගයේ අඩංගු පොස්පරස් ($P_2O_5$) ප්‍රතිශතය

1) 20% කි.
2) 27% කි.
3) 45% කි.
4) 60% කි.

14. මෙම රූපසටහනෙහි දැක්වෙන රෝග ත්‍රිකෝණය අනුව වගා බිමෙහි ව්‍යාධිජනකයාට අහිතකර පරිසර තත්ත්ව පවත්වාගෙන යාමෙන් ශාක රෝග පාලනය සඳහා ගත හැකි උපාය මාර්ගයක් නම්,




1) පාංශු ජීවාණුහරණය
2) ප්‍රතිරෝධී බෝග ප්‍රභේද වගා කිරීම
3) ආසාදිත ශාක කොටස් පිළිස්සීමය
4) බෝගයේ පැළ අතර පරතරය වැඩි කිරීම

15. ප්‍රාථමික බිම් සැකසීමට අයත් ක්‍රියාවක් වන්නේ,

1) පස් පිඩැලි කැපීම හා පෙරලීම ය
2) කැට පොඩිකිරීම ය
3) ඇළි හා වැටි දැමීම ය
4) පස මට්ටම් කිරීම ය

16. වගාබිමක සී සෑමෙන් පසුව කැට පොඩි කිරීම සඳහා වඩාත් සුදුසු,

1) තැටි නඟුල ය
2) රිජරය
3) කොකු නඟුල
4) ජපන් පරිවර්ත්‍ය නඟුලය

17. ක්ෂේත්‍රයේ සිටුවීමේ දී පැළයේ මුල් වලට සිදුවන හානිය අවම කිරීමේ අරමුණ ඇතිව සකසනු ලබන තවාන් වර්ගය නම්,
   1) මඩ තවාන් ය.
   2) ඩැපොග් තවාන් ය.
   3) පාත්ති තවාන් ය.
   4) පොරිදෝජෙකෝ තවාන් ය.

18. පළල් පත්‍ර වල් පැළෑටි වර්ග පමණක් අඩංගු වරණය කුමක් ද?
   1) වීඩලියා, නිදිකුම්බා හා ජපන් ජබර ය.
   2) ඉවක්, ගඳපාන හා මොණරකුඩුම්බිය ය.
   3) කුනැස්ස, කලාදුරු හා මානා ය.
   4) මාරුක්, බජිරි හා පාතිනියම් ය.

19. කුකර්බිටේසියේ කුලයේ බෝගවල පත්‍ර හා මුල්වලට හානි පමුණුවන පූර්ණ රූපාන්තරණය සහිත කෘමි පළිබෝධකයකු වනුයේ,
   1) ඉල් මැස්සා ය
   2) කුඩිත්තා ය
   3) අඹුලකපෝරා ය
   4) එපිලැක්නා ය

20. සහතික කරන ලද බිත්තර වී බීජවල තිබිය යුතු ප්‍රරෝහණ ප්‍රතිශතය අවම වශයෙන්,
   1) 85% කි
   2) 90% කි
   3) 95% කි
   4) 98% කි

21. බද්ධ කිරීම සඳහා අනුජයක් තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණක් නොවන්නේ,
   1) අනුජය සක්‍රීය වීමට ආසන්න අවස්ථාවේ පැවතීම.
   2) කඳේ විශ්කම්භය ග්‍රාහකයේ විශ්කම්භය හා ගැළපීම.
   3) ශක්තිමත් මූල පද්ධතියක් තිබීම.
   4) අනුජය ලබා ගන්නා මව් ශාකය නිරෝගී මෙන්ම පළිබෝධ හානිවලින් තොරවීම.

22. මව් ශාකයේ ලක්ෂණ සහිත පැළ අති විශාල සංඛ්‍යාවක් නිපදවාගත හැකි ප්‍රචාරණ ක්‍රමයක් නම්,
   1) දඬු කැබලි සිටුවීම ය.
   2) අතු බැඳීම ය.
   3) බද්ධ කිරීම ය.
   4) පටක රෝපණය ය.

23. යම් භූමියක පස, ජලය, පෝෂක හා ජෛව විවිධත්වය ආරක්ෂාවන පරිදි යෙදවුම් අවම කර ගනිමින් පවත්වාගෙන යනු ලබන පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රමය වනුයේ,
   1) සමෝධානික ගොවිතැන යි.
   2) සංරක්ෂණ ගොවිතැන යි.
   3) හේන් ගොවිතැන යි.
   4) ශෂ්‍ය මාරු ගොවිතැන යි.

24. ගොයම් පැළෑටියේ ප්‍රජනක අවධිය ලෙස හඳුන්වන්නේ,
   1) බීජ ප්‍රරෝහණයේ සිට බීජ මූලාකෘති ඇතිවීම දක්වා කාලය යි.
   2) පුෂ්ප මූලාකෘති ඇතිවීමේ සිට පීදීම දක්වා කාලය යි.
   3) පුෂ්ප මූලාකෘති ඇතිවීමේ සිට අස්වනු මේරීම දක්වා කාලය යි.
   4) පීදීමේ සිට අස්වනු මේරීම දක්වා කාලය යි.

25. ස්වභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහයක් වන බල්බිල දක්නට ලැබෙන්නේ පහත සඳහන් කුමන ශාකයේ ද?
   1) අර්තාපල්
   2) ලොකුළූනු
   3) ගොටුකොළ
   4) ගෝනිගස්

26. පොහොර ජලයෙහි දියකර බෝගවලට යෙදිය හැකි වඩාත් කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමය කුමක් ද?
   1) පිටාර ජල සම්පාදනය
   2) වළලු ජල සම්පාදනය
   3) බිංදු ජල සම්පාදනය
   4) තීරු ජල සම්පාදනය

27. ජෑම් නිෂ්පාදනයේ දී යොදාගනු ලබන ප්‍රධාන ආහාර පරිරක්ෂක ක්‍රමය වනුයේ,
   1) සාන්ද්‍රීකරණය යි.
   2) අවම සැකසීම යි.
   3) උෂ්ණත්ව පාලනය යි.
   4) පැසවීම යි.

28. අංකුර බද්ධයක් සඳහා ග්‍රාහකයේ T හැඩැති කැපුමක් යොදන විට, එයට සම්බන්ධ කිරීමට සුදුසු අනුජයේ හැඩය මින් කුමක් ද?

1) 
2) 
3) 
4) 

29. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ දී යොදා ගන්නා ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහයක් වනුයේ,
   1) පාත්ති ආවරණය
   2) පේළි ආවරණය
   3) සරළ සූර්යය ප්‍රචාරකය
   4) දැල් ගෘහය

30. පසු අස්වනු තාක්ෂණයේ ප්‍රධාන අරමුණ නම්,
   1) අස්වනු නෙලීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම ය.
   2) පසු අස්වනු කළමනාකරණ මඟින් අස්වනු හානිය අවම කිරීම ය.
   3) අස්වනු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් පෙට්ටි භාවිතා කිරීම ය.
   4) අස්වනු ගබඩා කිරීම ට ශීත කාමර භාවිතා කිරීම ය.

31. පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කිරීම සඳහා අවශ්‍ය වන මිනුම් වනුයේ,
   1) ශරීර බර හා උස ය.
   2) උපත් බර හා වයස ය.
   3) උස හා ඉණෙහි වට ප්‍රමාණය ය.
   4) රුධිරයේ අඩංගු සීනි ප්‍රමාණය හා උස ය.

32. ආහාර නරක්වීම කෙරෙහි බලපාන සාධක භෞතික , රසායනික හා ජෛව විද්‍යාත්මක වශයෙන් බෙදා දැක්විය හැකිය. පහත සඳහන් සාධක අතරින් ආහාර නරක්වීමට බලපාන රසායනික සාධකය වනුයේ,
   1) ආහාරයේ තෙතමනය යි.
   2) පරිසර උෂ්ණත්වය යි.
   3) ආහාර තුළ සිදුවන එන්සයිමීය ක්‍රියා යි.
   4) ආහාර මත දිලීර වර්ධනය යි.

33. කිරි ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කරනු ලබන ඉන්දිය ගව වර්ගයක් වන්නේ,
   1) ජර්සි
   2) ෆ්‍රීෂියන්
   3) අයර්ශයර්
   4) සින්දි

34. එළදෙනකගේ මද චක්‍රය දින,
   1) 21 කි
   2) 30 කි
   3) 285 කි
   4) 305 කි

35. සතුන්ට ලබා දෙන ආහාර වල අඩංගු විය යුතු ප්‍රධාන පෝෂක අතරින් සතුන්ගේ වර්ධනය සහ ගෙවී ගිය පටක අලුත්වැඩියා කිරීම යන කාර්යය සඳහා වැදගත් පෝෂකය වනුයේ,
   1) කාබොහයිඩ්‍රේට් ය
   2) ප්‍රෝටීන් ය
   3) ලිපිඩ ය
   4) විටමින් ය

36. සත්ත්ව ආහාර දළ ආහාර හා සාන්ද්‍ර ආහාර ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදිය හැකිය. ගවයින් සඳහා ලබා දිය හැකි සාන්ද්‍ර ආහාරයකි.
   1) සයිලේජ්
   2) පිදුරු
   3) තණ
   4) පුන්නක්කු

37. ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ දී ආස්තරණය ලෙස යොදාගැනීමට සුදුසු ද්‍රව්‍යයක් වන්නේ,
   1) වියළාගත් පොල් කුඩු ය
   2) රළු වැලි ය
   3) දහයියා ය
   4) කොහු බත් ය

38. කුකුළන්ට වැළඳෙන කොක්සිඩියෝසිස් රෝගයේ ව්‍යාධිජනකයා වනුයේ,
   1) බැක්ටීරියාවකි
   2) ප්‍රොටොසෝවාවෙකි
   3) වට පණුවෙකි
   4) වයිරසයකි

39. ආහාරයක ඉන්ද්‍රිය ගෝචරතාවය ඇගයීමේ පරීක්ෂණයක දී යොදාගනු ලබන ඉන්ද්‍රිය ගෝචර ලක්ෂණ නම්,
   1) පෙනුම, රසය, ගන්ධය හා වයනය වේ.
   2) පැහැය, වයනය, මිල හා කල් ඉකුත්වීමේ දිනය
   3) පෙනුම, රසය, වර්ණය හා මිල වේ
   4) පැහැය, පෝෂණ ගුණය, ගන්ධය හා නිෂ්පාදිත දිනය වේ

40. පහත දැක්වෙන කෙටි යෙදුම් අතරින් ආහාරයක ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිය දක්වන යෙදුම කුමක් ද?
   1) SLS
   2) ISO
   3) BMI
   4) INS

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය - II | කාලය : පැය 02 යි. |
|---|---|---|

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1). සාර්ථක බෝග වගාවක් සඳහා එම බෝගවලට අවශ්‍ය වායව පරිසරය හා පාංශු පරිසරය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යා යුතුය. සමහර බෝගවල අස්වැන්න වසරේ ඒ ඒ කාලවල දී පමණක් ලැබේ. එම අතිරික්ත අස්වනු පරිරක්ෂණය කිරීමෙන් ආහාර අවශ්‍යතාවය සපුරාගත හැකිය.

(1) a) බෝග වගාවට බලපාන දේශගුණික සාධක දෙකක් නම් කරන්න.
b) දේශගුණික සාධක අතරින් වගා කාලය / කන්නය තීරණය කිරීමට බලපාන සාධකය කුමක් ද?

(2) a) බෝග අස්වැන්න වැඩිකර ගැනීමට බලපාන පාංශු භෞතික සාධක දෙකක් නම් කරන්න.
b) බෝග වගා කිරීමේ දී අධික ලෙස පස ආම්ලික වූ විට ඇතිවිය හැකි ගැටලුවක් සඳහන් කරන්න.

(3) a) ශ්‍රී ලංකාවේ යොදාගන්නා ආරක්ෂිත ගෘහ වර්ග දෙකක් නම් කරන්න.
b) ආරක්ෂිත ගෘහ තුළ වගා කිරීමේ දී උෂ්ණත්වය වැඩි වීම පාලනය ට යොදාගන්නා උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(4) a) නිර්පාංශු බෝග වගාවේ දී යොදා ගන්නා රෝපණ මාධ්‍ය දෙකක් නම් කරන්න.
b) රෝපණ මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(5) කෘෂි නිෂ්පාදන පහසුවෙන් නරක් වීම සිදු වේ. එසේ නරක්වීමට බලපාන බාහිර පසු අස්වනු සාධක දෙකක් සඳහන් කරන්න.

(6) පසු අස්වනු හානිය යනු කුමක්දැයි හඳුන්වන්න.


(7) පහත දැක්වෙන එළවළු බෝග, කල්තබා ගැනීම ට යොදාගත හැකි පරිරක්ෂණ ක්‍රමයක් බැගින් ලියා දක්වන්න.
a) කරවිල
b) තක්කාලි

(8) අතිරික්ත කිරි වලින් සකස් කරගත හැකි ආහාර වර්ග දෙකක් නම් කරන්න.

(9) a) බෝග වගාව, සත්ත්ව පාලනය හා බලශක්ති නිෂ්පාදනය ඒකාබද්ධව සිදු කරමින් පවත්වාගෙන යන ගොවිතැන් ක්‍රමය කුමක්ද?
b) එම ක්‍රමයේ වාසියක් ලියන්න.

(10) a) වර්තමානයේ රටේ පවතින ආර්ථික අහේනිය හමුවේ පුද්ගලයෙකු ගනු ලබන පෝෂක ප්‍රමාණය අඩු වීමෙන් සුලබව දක්නට ලැබෙන රෝගී තත්ත්වයක් නම් කරන්න.
b) එම රෝගී තත්ත්වයට බහුලව ගොදුරු වන සමාජයේ කොටස් දෙකක් නම් කරන්න.

(2). ශාකවල පැවැත්ම සඳහා පරිසරය තුළ ස්වාභාවිකව සිදුවන ශාක ප්‍රචාරණ ක්‍රමය ලිංගික ප්‍රචාරණ ක්‍රමය යි. එහිදී බීජ මගින් විශේෂ කාර්යයක් ඉටු කෙරේ.




I. a) ඉහත රූප සටහනේ A,B,C කොටස් නම් කරන්න.
b) මෙම බීජ ප්‍රරෝහණ ක්‍රමය නම් කරන්න.

II. a) බීජ ප්‍රරෝහණයට අවශ්‍ය සාධක දෙකක් නම් කරන්න.
b) එවැනි ප්‍රරෝහණ ආකාරයක් පෙන්වන බීජ වර්ග දෙකක් සඳහන් කරන්න.

III. a) සිටුවීම සඳහා යෝග්‍ය බීජවල තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.
b) ඉහත ආකාරයට ප්‍රරෝහණය නොවන ඇතැම් බීජවල එම තත්ත්වය ඉවත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(3). ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය ඇතිකර ගැනීමත්, ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වන බත සැපයීමත් වී ශාකය මගින් සිදුවන බැවින් වී වගාව පිළිබඳ ව අධ්‍යයනය කිරීම වැදගත් වේ.

I. ශ්‍රී ලංකාවේ වී වගාවට ඇති විභවයන් තුනක් සඳහන් කරන්න.

II. වී වගාවේ දී භාවිතා කරනු ලබන තවාන් වර්ගයක් නම් කරන්න.

III. a) වී වගාවත් සමඟ වැඩෙන වල් පැළෑටි තුනක් සඳහන් කරන්න.
b) වී වගාවේ පළිබෝධ පාලනයට යොදාගත හැකි පරිසර හිතකාමී ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(4). ගොවි මහතෙකු තම එළවළු වගාවේ එක්තරා කෘමියෙකු නිතර ගැවසෙනු දුටුවේය. මෙම කෘමියා බිත්තර දමනුයේ පැළයේ පාදස්ථයට ආසන්නව පසෙහිය. මෙම කෘමියාගේ රූප සටහනක් මෙහි දැක්වේ.



I. a) මෙම කෘමියා නම් කරන්න.
   b) මෙම කෘමියා හානිකරන බෝග දෙකක් නම් කරන්න.

II. a) මෙම කෘමියාගේ ජීවන චක්‍ර අවස්ථා මොනවාද?
   b) වැඩි වශයෙන් බෝග වලට හානි කරන්නේ මෙම කෘමියාගේ ජීවන චක්‍රයේ කුමන අවස්ථාව ද?

III. මෙම කෘමියා මර්ධනය සඳහා යොදා ගැනෙන පාලන ක්‍රම තුනක් සඳහන් කරන්න.

(5). මෙම දිනවල අධික වර්ෂාපතනය නිසා බෑවුම් සහිත භූමි වල සෝදාපාලු වීමට ලක්වීම හා නායයෑම් බහුලව දක්නට ලැබේ.

I. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම තුන නම් කරන්න.

II. a) පාංශු හායනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   b) පාංශු හායනයට හේතු දෙකක් දක්වන්න.

III. a) වර්ෂාපතනය නිසා සිදුවන පාංශු ඛාදන ආකාර හතරක් සඳහන් කරන්න.
   b) පාංශු ඛාදන කාරක දෙකක් සඳහන් කරන්න.
   c) අධික බෑවුම් සහිත භූමි වල පාංශු ඛාදනය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(6). සත්ත්ව පාලනයේදී සැලකිල්ලට ගත යුතු විවිධ සාධක අතරින් නියමිත අවස්ථාවේ දී ගව දෙනුන් ගැබ් ගැන්වීමත් දිනක් වයසැති කුකුළු පැටවුන් පරිසරයට හැඩගැසෙන තෙක් බෲඩරයක් තුළ රැක බලා ගැනීමත් වැදගත් වේ.

I. a) ගව දෙනකගේ ගැබ් කාලය දින කීයද?
   b) ගව දෙනකගේ දැකිය හැකි මද ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
   c) ගව දෙනකගේ **"වියළි කාලය"** යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

II. a) ඉපදි පළමු සතිය තුළ කුකුළු පැටවුන්ට බෲඩරයේ දී සැපයිය යුතු උෂ්ණත්වය කොපමණ ද?
   b) උෂ්ණත්වය හැරුණුවිට බෲඩරය තුළ කුකුළු පැටවුන්ට සපයා දිය යුතු වෙනත් අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

III. වැඩි උෂ්ණත්වයේ දී, අඩු උෂ්ණත්වයේ දී හා ප්‍රශස්ත උෂ්ණත්වයේ දී බෲඩරය තුළ කුකුළු පැටවුන්ගේ හැසිරීම වෙන් වෙන් වශයෙන් රූප සටහනක් ඇසුරින් පෙන්වන්න.

(7). අතිරික්ත කෘෂි නිෂ්පාදන කල්තබා ගැනීම සඳහා ඒවා පරිරක්ෂණය කරනු ලැබේ. එමගින් ආහාර නරක් වීමෙන් සිදුවන නාස්තිය අඩුකර ගත හැකිය.

I. a) පහත දැක්වෙන බෝග නිෂ්පාදන ක්‍රියාවලියට අදාලව, A හා B පියවර සඳහන් කරන්න.
   අස්වනු නෙළීම → සැකසීම → ඇසිරීම → A → B → අලෙවිය
   b) නරක් වූ ආහාර හඳුනාගත හැකි ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

II. a) ආහාර පරිරක්ෂණ මූලධර්ම හතරක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.
   b) ආහාර ඇසුරුම්කරණයට යොදා ගන්නා කෘතිම ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

III. a) ආහාර කල් තබා ගැනීම සඳහා භාවිතා කරන පරිරක්ෂක ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.
   b) ආහාර බාල කිරීම සිදු කරන අවස්ථා සඳහා උදාහරණ දෙකක් සඳහන් කරන්න.

උවපළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය | |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

ලකුණු ලබා දීමේ පටිපාටිය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 1 | 21 | 3 | 31 | 1 |
| 02 | 4 | 12 | 1 | 22 | 4 | 32 | 3 |
| 03 | 2 | 13 | 4 | 23 | 2 | 33 | 4 |
| 04 | 3 | 14 | 1 | 24 | 3 | 34 | 1 |
| 05 | 3 | 15 | 1 | 25 | 4 | 35 | 2 |
| 06 | 2 | 16 | 3 | 26 | 3 | 36 | 4 |
| 07 | 3 | 17 | 4 | 27 | 1 | 37 | 3 |
| 08 | 4 | 18 | 1 | 28 | 4 | 38 | 2 |
| 09 | 2 | 19 | 3 | 29 | 2 | 39 | 1 |
| 10 | 3 | 20 | 1 | 30 | 2 | 40 | 2 |

II පත්‍රය

01. (a) වර්ෂාපතනය, ආලෝකය, උෂ්ණත්වය, සුළඟ, සාපේක්ෂ ආර්ද්‍රතාවය (ලකුණු ½x2)
(b) වර්ෂාපතනය (ලකුණු 01)

02. (a) පාංශු වයනය, පාංශු ව්‍යුහය, පාංශු වර්ණය, පාංශු ගැඹුර (ලකුණු ½x2)
(b) 1. යකඩ, ඇලුමිනියම් සහ මැංගනීස් අයනවල ද්‍රාව්‍යතාව වැඩි වීම නිසා බෝගවලට විෂවීම් ඇතිවේ.
2. අද්‍රාව්‍ය පොස්පරස් සංයෝග සැදෙන බැවින් ශාකවලට පොස්පරස් ලබාගත නොහැකි වේ.
3. බැක්ටීරියා ක්‍රියාකාරිත්වය දුර්වල වේ. (ලකුණු 01)

03. (a) පොලිතීන් ගෘහ, දැල් ගෘහ, ලී පටි (ලැත්) ගෘහ, හරිතාගාර (ලකුණු ½x2)
(b) වහලයේ මුදුන මට්ටම් දෙකකට සැකසීම
විවෘත කළ හැකි කවුළු යෙදීම
වහළයට සවිකළ පංකා
පැති බිත්තිවලට පංකා සවි කිරීම
ගෘහය ඇතුළත මීදුමක් ආකාරයට ජලය ඉසීමට සැලැස්වීම
කෘමි ප්‍රතිරෝධී දැල් යෙදීම (ලකුණු ½x2)

04. (a) කොහුබත්, බොරළු, වැලි, දහයියා/දහයියා අඟුරු, කොහුකෙඳි, කොකෝපීට්, පර්ලයිට් (ලකුණු ½x2)
(b) මනා වාතනයක් පැවතීම, මනා ලෙස ජල වහනය සිදුවීම, ජලය රඳවා ගැනීමේ හැකියාව,ස්වාරක්ෂක ගුණය, පළිබෝධවලින් තොරවීම (ලකුණු ½x2)

05. 1 අයහපත් දේශගුණික තත්ත්ව, පළිබෝධ හානි, අයහපත් පරිහරණ විධි (ලකුණු 02)

06. බෝගයක අස්වනු නෙළීමේ සිට එය පරිභෝජනය දක්වා ක්‍රියාවලියෙහි පියවර තුළ සිදුවන අස්වනු හානියට බලපාන සාධක වේ. (අස්වනු නෙළීම/ සැකසීම/ ඇසිරීම/ ප්‍රවාහනය/ ගබඩා කිරීම/ අලෙවි කිරීම(ලකුණු 02)

07. කරවිල - වියළීම (සූර්යය තාපය මඟින් වියළීම)
තක්කාලි- ජෑම්, සෝස්, චට්නි (සාන්ද්‍රීකරණය) (ලකුණු 1x2)

08. යෝගට්, මුදවපු කිරි, කල්කිරි, චීස්, රසකළ කිරි (ලකුණු 1x2)

09. (a) සමෝධානිත ගොවිතැන (ලකුණු 01)

(b) සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා/ගත හැකිවීම
පසේ භෞතික/ රසායනික සහ ජෛව ගුණාංග දියුණු වීම
පොහොර හා බලශක්තිය සඳහා යන පිරිවැය අඩුවීම
වසර පුරා ආදායම් ලැබීම (ලකුණු 01)

10 (a) මන්දපෝෂණය (ලකුණු 01)

(b) ළදරුවන්, ළමුන්, ගර්භණී මව්වරුන්, කිරිදෙන මව්වරුන් (ලකුණු 01)

(මුළු ලකුණු 20)

02. I (a) A බීජාධරය
B බීජ පත්‍ර
C බීජෝපරිය (ලකුණු 03)

(b) අපිභෞම ප්‍රරෝහණය (ලකුණු 01)

II (a) බීජයේ ජීව්‍යතාවය
තෙතමනය/ ජලය
වාතය/ ඔක්සිජන්
ප්‍රශස්ථ උෂ්ණත්වය
ආලෝකය (ලකුණු ½x2)

(b) මුං, බෝංචි, මිරිස්, දඹළ (ලකුණු ½x2)

III (a) ප්‍රවේණික පාරිශුද්ධතාවය (එකම ප්‍රභේදයේ බීජ වීම)
භෞතික පාරිශුද්ධතාවය
බොල් බීජවලින් තොරවීම
වල් පැළෑටි බීජවලින් තොරවීම
ඉහළ ප්‍රරෝහණ ප්‍රතිශතයක් තිබීම (85%ට වැඩි) (ලකුණු 1x2)

(b) ඝන බීජාවරණය ඉවත් කිරීම
ජලයේ පෙඟවීම
බීජාවරණය මද වශයෙන් පිළිස්සීම
ජලයෙන් සෝදා බීජාවරණයේ ඇති නිෂේදක ද්‍රව්‍ය ඉවත් කිරීම
දිලීර නාශක සමඟ මිශ්‍ර කර සිටුවීම
වැලි මිශ්‍ර කර වැපිරීම (ලකුණු 1x2)

(මුළු ලකුණු 10)

03. I ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම වී වගා කළ හැකිවීම
වී වගාවට අදාල පර්යේෂණ හා අභිජනන මධ්‍යස්ථාන ප්‍රාදේශීය මට්ටමින් පැවතීම
විවිධ දේශගුණික හා පාංශු තත්ත්වවලට ගැලපෙන වී ප්‍රභේද රාශියක් ශ්‍රී ලංකාවේ පැවතීම
රාජ්‍ය අනුග්‍රහය තිබීම (ලකුණු 03)

II ඩැපොග් තවාන (ලකුණු 02)

III (a) තුනැස්ස, තුන්හිරියා, ගිරාපලා, බටදැල්ල (ලකුණු 03)

(b) යාය එකට වගා කිරීම
ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම
සමතුලිත පොහොර මිශ්‍රණ යෙදීම
පැළ අතර පරතරය වැඩි කිරීම
ජලය බැඳ තැබීම
සාම්ප්‍රදායික පළිබෝධ පාලන ක්‍රම අනුගමනය කිරීම (ලකුණු 02)

(මුළු ලකුණු 10)

04. I (a) අවුලකපෝරා (ලකුණු 01)

(b) කරවිල, වැටකොලු, පතෝල (ලකුණු 02)

II (a) බිත්තර, කීට, පිළවා, සුහුඹුලා (ලකුණු 1/2x4)

(b) කීට, සහුඹුල් (ලකුණු 1x2)

III සුහුඹුල් සතුන් අතංගුවකින් අල්ලා විනාශ කිරීම
පැළ අවට පස බුරුල් කිරීම
රසායනික පළිබෝධනාශක භාවිතය (ලකුණු 1x3)

(මුළු ලකුණු 10)

05 I සංවහන
මෝසම්
වාසුළි (ලකුණු 03)

II (a) පසේ භෞතික, රසායනික සහ ජෛව ගුණාංග වගාවට අයහපත් වීමෙන් පසේ බෝග නිෂ්පාදන ශක්තිය හීනවීම පාංශු හායනය ලෙස හැඳින්වේ. (ලකුණු 01)

(b) පසෙහි තදබව ඇතිවීම
පස ආම්ලික හෝ ක්ෂාරීය වීම
පාංශු ඛාදනය (ලකුණු ½ x2)

III (a) විසිරි ඛාදනය
ස්ථරීය ඛාදනය
ඇළි ඛාදනය
ඇඟිලි ඛාදනය
දිය පහර ඛාදනය (ලකුණු ½ x4)

(b) වර්ෂා ජලය
වේගවත් සුළඟ
මුහුදු රළ හා ගංඟා රළ
මිනිසුන්ගේ හා සතුන්ගේ ක්‍රියාකාරකම් (ලකුණු ½ x 2)

(c) සමෝච්ඡ රේඛා අනුව සී සෑම
සමෝච්ඡ රේඛා අනුව වගා කිරීම
භෞතික භූමි වර්ගීකරණය අනුව සුදුසු බෝග තෝරා ගැනීම
සමෝච්ඡ රේඛා මත පස්වැටි ඇමීම
හෙල්මළු ආකාරයට භූමිය සැකසීම
සමෝච්ඡ කානු යෙදීම (ලකුණු 1x2)
(මුළු ලකුණු 10)

06. I (a) ගැබ් කාලය දින 280±5 = 285 (ලකුණු 01)


(b) ආහාර ගැනීම අඩුවීම
නිතර නිතර කෑ ගැසීම
යෝනිය ඉදිමී රතු වීම
වරින් වර කොන්ද නමා මුත්‍රා කිරීම
නොසන්සුන් බවක් දැක්වීම
පැහැදිලි අවර්ණ උකු ස්‍රාවයක් යෝනියෙන් වැගිරීම
අනෙක් සතුන්ට පිට උඩ නැගීමට ඉඩ දීම
පිට මත අත තැබූ විට නොසෙල්වී සිටීම
කිරි නිෂ්පාදනය අඩුවීම (ලකුණු ½ x4)

(c) වියළි කාලය - ප්‍රසූතියට පූර්වාසන්න කිරි දෙවීම සිදු නොකරන දින 60ක (මාස දෙකක) කාලය
(ලකුණු 01)

II (a) පළමු සතියේදී බෲඩරයේ උෂ්ණත්වය 33℃ - 35℃ (ලකුණු 01)

(b) බෲඩරයේ අවශ්‍යතා - ආහාර, ජලය, ඉඩකඩ, ආරක්ෂාව (ලකුණු 1x2)

III



වැඩි උෂ්ණත්වයේ දී | අඩු උෂ්ණත්වයේ දී | ප්‍රශස්ත උෂ්ණත්වයේ දී

(ලකුණු 1x3)
(මුළු ලකුණු 10)

07. I (a) A- ප්‍රවාහනය
B- අස්වනු ගබඩා කිරීම (ලකුණු 1x2)

(b) වර්ණය වෙනස් වීම
ගන්ධය වෙනස් වීම
පෙනුම වෙනස් වීම
රසය වෙනස් වීම
වයනය වෙනස් වීම
පෝෂණීය අගය වෙනස් වීම (ලකුණු ½ x2)

II (a) මූලධර්ම
විජලනය, සාන්ද්‍ර කිරීම, උෂ්ණත්ව පාලනය, විකිරණ භාවිතය, pH අගය වෙනස් කිරීම, ආහාර පරිරක්ෂක එක් කිරීම, ක්ෂුද්‍ර ජීවීන් යොදා ගැනීම
උදා - විජලනය
ආහාරයේ අඩංගු ජල ප්‍රතිශතය අඩු කිරීමයි
උදාහරණ - අව්වේ වියළීම - එළවළු, කරවල, ධාන්‍ය
උඳුනේ වියළීම - කජු, රටකජු, හාල්මැස්සන්
දුම් ගැසීම - ගොරකා, මාළු, අටු කොස්
සූර්යය තාප වියලනය මඟින් වියළීම - එළවළු
(ඉතිරි උදාහරණ සඳහා පෙළ පොත පරිහරණය කරන්න) (විස්තර කිරීමට 01)
(නම් කිරීමට ½ x2)

(b) වීදුරු, ප්ලාස්ටික්, පොලිතීන්, කඩදාසි, ලෝහමය ද්‍රව්‍ය (ලකුණු½ x2)

III (a) පොටෑසියම් මෙටාබයිසල්ෆයිඩ (KMS)
සෝඩියම් මෙටාබයිසල්ෆයිඩ (SMS)
බෙන්සොයික් අම්ලය
සෝඩියම් නයිට්‍රේට්
සෝඩියම් නයිට්‍රයිට් (ලකුණු ½ x2)

(b) කහවලට තිරිඟු පිටි මිශ්‍රණය කිරීම
සහල් පිටි හෝ කුරක්කන් පිටිවලට තිරිඟු පිටි මිශ්‍ර කිරීම
ඉවත දමන තේ කුඩුවලට කෘත්‍රිම වර්ණක මිශ්‍ර කිරීම
ගම්මිරිස් බීජවලට පැපොල් බීජ එකතු කිරීම (ලකුණු ½ x2)
(මුළු ලකුණු 10)